## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ (පැයකට ගෙවීමේ පදනම මත)

**1. <u>හෙද සොහොයුරි</u>**

**<u>සුදුසුකම්:</u>**

I. I වන ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

සහ

II. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත් වූ නිලධරයෙකු වීම.

සහ

III. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබීම.

සහ

IV. පූර්වාසන්නතම වසර (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

V. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

## 2. <u>පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී</u>

**<u>සුදුසුකම්</u>**

I. සිංහල /දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් **03** ක් එක්වරකදී සමත් වී තිබීම.

සහ

III. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාළව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන වසර එකහමාරක (1 ½) පූර්ණකාලීන වෘත්තීය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

සහ

IV. කාන්තා පක්ෂයට පමණක් අයදුම් කළ හැක.

**<u>පොදු කොන්දේසි :</u>**

1. හෙද සොහොයුරි සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර වෙනුවෙන් එක් පැයක් සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ 2017.06.02 දිනැති චක්‍රලේඛ අංක TA/G/PSM/13/2016 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.

2. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2024.12.30** දිනට හෝ ඊට පෙර “විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර” යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

3. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සතුවේ.

4. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී යොමුකරනු ලබන හෝ නියමිත ආකෘතියට අනුකූල නොවන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. මෙම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලයීය රෝහල් කාර්යමණ්ඩලය වෙත බඳවා ගනු ලබන අතර විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නොවේ.

6. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.<u>www.kdu.ac.lk</u> / දුරකථන අංකය – 0112044555.